## Business and Accounting studies



# රක්ෂණ සේවා
# Insurance

සැකසුම හා ඉදිරිපත් කිරීම:-

**ධම්මික හෙට්ටිආරච්චි**


# අන්තර්ගතය

## රක්ෂණ සංකල්පය

- ජීවිත රක්ෂණය
- දේපල රක්ෂණය

## රක්ෂණ මූලධර්ම

- රක්ෂණ හිමිකම
- උපරිම විශ්වාසය
- හානි පූර්ණය




සැකසුම හා ඉදිරිපත් කිරීම:-

**ධම්මික හෙට්ටිආරච්චි**

# 👉 රක්ෂණය යනු කුමක්ද?




- අවදානම් ඒකරාශී කර එක් පාර්ශවයකට සිදුවන හානිය හෝ පාඩුව සාමූහිකව බෙදා ගැනීම රක්ෂණයයි.

## රක්ෂණයේ පදනම කුමක්ද?

- රක්ෂණයේ පදනම අවදානම් ඒකරාශී කිරීම වේ.

## රක්ෂණයේ අවශ්‍යතාව කුමක්ද?

- අනපේක්ෂිත සිදුවීම් වලින් ජීවිත හා දේපලවලට සිදුවන හානි සඳහා මූල්‍යමය රැකවරණයක් ලබා ගැනීමයි.

# පුද්ගලයන්ට හෝ ව්‍යාපාරිකයන්ට මුහුණ දීමට සිදුවන විවිධ අවදානම් මොනවාද?

- හදිසි ගිනි ගැනීම්
- සුළි සුළං
- ගංවතුර
- සුනාමි
- භූමි කම්පා
- හදිසි අනතුරු
- කලකෝලාහල



## 👉 රක්ෂණ ගිවිසුමක් යනු කුමක්ද?

- රක්ෂණ ආවරණයක් ඉල්ලා සිටින්නා ඉදිරිපත් කරන රක්ෂණ යෝජනා පත්‍රයක් රක්ෂණ ආයතනයක් විසින් පිළිගැනීමෙන් පසුව දෙපාර්ශවය අතර ඇතිකර ගන්නා ලිඛිත එකඟතාවය දැක්වෙන ලියවිල්ල රක්ෂණ ගිවිසුම වේ.

# 👉 රක්ෂණ ගිවිසුමකට සම්බන්ධ වන පාර්ශ්වයන් හඳුන්වන්න.

- **පළමු පක්ෂය - රක්ෂිතයා**
  - රක්ෂණ ආවරණය ලබා ගන්නා පාර්ශ්වයන්.
- **දෙවන පක්ෂය - රක්ෂකයා**
  - රක්ෂණ අවදානම බාරගන්නා පාර්ශ්වය. එනම් රක්ෂණ ආයතනයයි.
- **තෙවන පක්ෂය - බාහිර පාර්ශ්ව**
  - රක්ෂණ ගිවිසුමකින් බලපෑමක් වන අනෙකුත් සියලුම පාර්ශව වේ.

**නිදසුන් :**

- වාහනයක් රක්ෂණය කළ විට පාරේ ගමන් ගන්නා අනෙකුත් වාහන හා මගින් තෙවන පක්ෂය වේ.




Dhammika hettiarachchi


# 👉රක්ෂණ මූලධර්ම යනු කුමක්ද?

- රක්ෂණ ව්‍යාපාරය ක්‍රමවත්ව හා විධිමත්ව පවත්වාගෙන යාමට අවශ්‍යයෙන්ම තිබිය යුතු ගුණාංග රක්ෂණ මූලධර්ම වේ.

# රක්ෂණ මූලධර්ම නම්කරන්න.

➢ රක්ෂණ සේවාව රක්ෂණ මූලධර්ම මත ගොඩනැගී ඇත. ඉන් කිහිපයක් පහතින් දැක්වේ

- රක්ෂ්‍ය හිමිකම.
- උපරිම විශ්වාසය.
- හානිපූරණය.



# 1. රක්ෂ්‍ය හිමිකම - Insurable interest



✓ ජීවිතයක් හෝ දේපළක් රක්ෂණය කිරීමට යම් පාර්ශ්වයකට ඇති නීත්‍යානුකූල අයිතිය රක්ෂ්‍ය හිමිකමයි.

## ❖ රක්ෂ්‍ය හිමිකමක් ඇතිවීමට තිබිය යුතු ලක්ෂණ.

- අදාල ජීවිතය හෝ දේපල පැවතීමෙන් ආර්ථික වාසියකුත් එය විනාශ වීමෙන් අවාසියකුත් සිදුවීම.
- ලබන වාසිය හෝ අවාසිය මුදලින් ගණනය කළ හැකි වීම.
- රක්ෂිතයා හා දේපල අතර සම්බන්ධය නීතිමය වශයෙන් ඔප්පු කළ හැකි වීම.

# රක්ෂ්‍ය හිමිකම සඳහා නිදසුන්.

- ස්වාමි පුරුෂයා හා භාර්යාව අතර එකිනෙකාගේ ජීවිතය පිළිබඳව රක්ෂ්‍ය හිමිකමක් පවතී.
- දේපල රක්ෂනයේ දී එම දේපළෙහි නීත්‍යානුකූල අයිතිකරුට රක්ෂ්‍ය හිමිකමක් ඇත.
- ණයක් දුන් තැනැත්තෙකුට දෙන ලද ණය ප්‍රමාණය දක්වා ණය ලබා ගත් තැනැත්තාගේ ජීවිතය රක්ෂණය කිරීමට හිමිකමක් ඇත.

## 2. උපරිම විශ්වාසය - Utmost good faith

- ✓ රක්ෂණයට සම්බන්ධ දෙපාර්ශ්වය විසින් රක්ෂණ ගිවිසුමට අදාළ වැදගත් යැයි හැඟෙන සියලු තොරතුරු නොසඟවා ඉදිරිපත් කළ යුතු බව මින් අදහස් වේ.

'උපරිම විශ්වාසය කඩ වුවහොත් රක්ෂණ ගිවිසුම අවලංගු වේ'

## 3. හානි පූරණය - Indemnity

- ✓ රක්ෂිත දේපළවලට හානි සිදුවූ විට එම හානිය යථා තත්වයට පත් කිරීමට සරිලන වන්දියක් පමණක් ගෙවිය යුතු බව මෙම මූලධර්මයෙන් අදහස් වේ.

'මෙම මූලධර්මය ජීවිත රක්ෂණය සඳහා අදාළ නොවේ'

*Dhammika hettiarachchi*

උදා :

රු. 2,000,000 ක් වටිනා මෝටර් රථය එම වටිනාකමටම රක්ෂණය කර ඇති විට, සිදුවූ රු. 500,000 ක හානියක් සඳහා වන්දි මුදලක් ලෙස ලබාගත හැක්කේ උපරිම වශයෙන් රු. 500,000 ක මුදලක් පමණි.

## ❖ රක්ෂණයේ ප්‍රධාන ප්‍රභේද

- පුද්ගල රක්ෂණය ( ජීවිත රක්ෂණය) .
- දේපළ රක්ෂණය.

# 1. පුද්ගල ආරක්ෂණය (ජීවිත රක්ෂණය)

- පුද්ගලයෙකුගේ ජීවිතය හා සම්බන්ධව සිදුවිය හැකි හානි වෙනුවෙන් වන රක්ෂණය ජීවිත රක්ෂණයයි.

## ❖ ජීවිත රක්ෂණ ගිවිසුමකට ඇතුළත් කර ගත හැකි අතුරු ආවරණ

- පුද්ගලයන්ට සිදුවන හදිසි අනතුරු.
- සෞඛ්‍ය ගැටලු.
- සැත්කම් හා රෝහල් ගාස්තු.






*Dhammika hettiarachchi*

# ජීවිත රක්ෂණයේ වැදගත්කම

- ඉතිරිකිරීමේ ක්‍රමයක් ලෙස හෝ ආයෝජන මාර්ගයක් ලෙස යොදාගත හැකි වීම.
- ඔප්පුව කල් පිරෙන තෙක් ජීවත් වුවහොත් රක්ෂිත මුදල හා අනෙකුත් ප්‍රතිලාභ රක්ෂිතයාට ලබාගත හැකි වීම.
- රක්ෂිතයා අකල් මරණයකට පත්වුවහොත් නම්කරන ලද අයට වන්දි ලබාගැනීමට හැකි වීම.
- දූ දරුවන්ගේ විවාහ, අධ්‍යාපන කටයුතුවලදී මූල්‍ය සහන ලබාගත හැකි වීම.
- මූල්‍ය ආයතනවලින් ණය ලබාගැනීමේදී ඇපයක් ලෙස භාවිතා කළ හැකි වීම.
- ලෙඩ රෝග සිදුවූ විට ඒ සඳහා වෛද්‍ය ගාස්තු ලබා ගත හැකි වීම.

# 2. දේපළ රක්ෂණය

- ගොඩනැගිලි, යන්ත්‍රසූත්‍ර, රථවාහන, බඩු තොග වැනි දේපළවලට සිදුවිය හැකි අවදානම් ආවරණය කිරීම වෙනුවෙන් ලබාගන්නා රක්ෂණය, දේපළ රක්ෂණය වේ.

## 👉 දේපළ රක්ෂණ ඔප්පු වර්ග

- ගිනි රක්ෂණ ඔප්පු.
- රථවාහන රක්ෂණ ඔප්පු.
- මුහුදු උවදුරු රක්ෂණ ඔප්පු.
- ස්වාභාවික විපත් සඳහා රක්ෂණ ඔප්පු.
- සොරකිය රක්ෂණය.
- වගකීම් රක්ෂණය

# දේපළ රක්ෂණයේ වැදගත්කම

1. ව්‍යාපාරවලට සිදුවිය හැකි විවිධ අවදානම් තුළින් පැනනගින මූල්‍ය අලාභ ආවරණය කර ගත හැකි වීම.

- ගිනි උවදුරු.
- සොර සතුරු උවදුරු.



2. ව්‍යාපාර කටයුතු අඛණ්ඩව කරගෙන යාමට උපකාරී වීම
3. දේශීය මෙන්ම විදේශීය වෙළෙඳාම් කටයුතුවලදී උපකාරී වීම.

- මුහුදු උවදුරු රක්ෂණය.
- බඩුතොග රක්ෂණය.
- අපනයන ණය රක්ෂණය.
- මාර්ගස්ථ මුදල් රක්ෂණය .






# ජීවිත රක්ෂණය හා දේපළ රක්ෂණය අතර ඇති වෙනස්කම්

| ජීවිත රක්ෂණය | දේපළ රක්ෂණය |
|---|---|
| ➢ අවදානම නිශ්චිත වේ. | ➢ අවදානම නිශ්චිත නොවේ. |
| ➢ රක්ෂණ ඔප්පුවේ වටිනාකම පුද්ගල කැමැත්ත හා ගෙවීමේ හැකියාව මත තීරණය වේ. | ➢ රක්ෂණ ඔප්පුවේ වටිනාකම දේපල වටිනාකම අනුව තීරණය වේ. |
| ➢ රක්ෂණ ඔප්පුව පැවරිය නොහැකිය. | ➢ රක්ෂණ ඔප්පු පැවරිය හැකිය. |
| ➢ හානිපූරණ මූලධර්මය බලනොපායි. | ➢ හානිපූරණ මූලධර්මය බලපායි. |
| ➢ ජීවිතයට හානියක් සිදු වුවත්, නොවූවත් රක්ෂිත මුදල ලබාගත හැකිය. | ➢ රක්ෂිත දේපලට හානියක් සිදුවුවහොත් පමණක් වන්දි ලබාගත හැකිය. |
| ➢ රක්ෂණ මුදලට අමතරව, ප්‍රසාද දීමනා, පොලී වැනි ප්‍රතිලාභ වලට හිමිකම් ලැබිය හැකිය. | ➢ අමතර ප්‍රතිලාභ නොලැබේ. |
| ➢ දිගුකාලීනය. | ➢ කෙටි කාලීනය. |

# ව්‍යාපාර කටයුතුවලට සහ ආර්ථික සංවර්ධනයට රක්ෂණය වැදගත් වන ආකාරය

- ව්‍යාපාර කටයුතු සංවර්ධනය සඳහා.
- ආර්ථික සංවර්ධනය සඳහා.
- විවිධ රැකියා අවස්ථා ජනිත වීම.
- ජාත්‍යන්තර වෙළඳාමේ වර්ධනයට රුකුලක් වීම.
- සේවා දායකයින්ගේ සහ පාරිභෝගිකයින්ගේ සුරක්ෂිතතාවය තහවුරු වීම.

## අප රටේ රක්ෂණ කටයුතුවල යෙදෙන ආයතන

- සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව
- සීමාසහිත සෙලින්කෝ රක්ෂණ සමාගම
- සීමාසහිත ජනශක්ති රක්ෂණ සමාගම
- සීමාසහිත ඒෂියන් එලායන්ස් රක්ෂණ සමාගම.
- සීමාසහිත යූනියන් ඇෂුවරන්ස් රක්ෂණ සමාගම

## විශේෂ රක්ෂණ ඔප්පු ලබාදෙන ආයතන

- ශ්‍රී ලංකා අපනයන රක්ෂණ සංස්ථාව
- කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය

*Dhammika hettiarachchi*

# අභ්‍යාස

01. රක්ෂණය (Insurance) හා ආරක්ෂණය (Assurance) අතර වෙනස පැහැදිලි කරන්න.

02. රක්ෂණය ව්‍යාපාර කටයුතුවල සංවර්ධනයට දායක වන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න.

03. පුද්ගලයෙකුට රක්ෂණය කළ හැකි අවදානම් හතරක් සඳහන් කරන්න.

04. රක්ෂණය කළ නොහැකි අවදානම් හතරක් දක්වන්න.

05. ව්‍යාපාරිකයන් හට ප්‍රයෝජනවත් වන රක්ෂණ ඔප්පු වර්ග හතරක් සඳහන් කරන්න.

06. පහත සඳහන් ප්‍රකාශ සත්‍යද අසත්‍යද යන්න දක්වන්න.



| අනු අංකය | ප්‍රකාශය | සත්‍ය/ අසත්‍ය |
|---|---|---|
| 01 | පුද්ගලයෙකුගේ ජීවිතය හා සම්බන්ධව සිදුවිය හැකි හානි ආවරණය වෙනුවෙන් සිදුකරනුයේ ආරක්ෂණයයි. | සත්‍ය |
| 02 | රක්ෂණ අරමුදලට සහභාගි වන පාර්ශවයකට සිදුවන හානිය එම සහභාගි වන පුද්ගලයන් අතර සාමූහිකව බෙදාගැනීම රක්ෂණයෙන් සිදුවේ. | සත්‍ය |
| 03 | දේපළ හෝ ජීවිත රක්ෂණය කළ විට ඒවායේ ඇති අවදානම නැතිවේ. | අසත්‍ය |
| 04 | දේපළ රක්ෂණ ඔප්පුවක වටිනාකම පුද්ගලයාගේ කැමැත්ත හා ගෙවීමේ හැකියාව අනුව තීරණය කළ හැකිය. | අසත්‍ය |
| 05 | රක්ෂණ ඔප්පුවක් ලබාගැනීමේදී රක්ෂිතයා හා රක්ෂකයා රක්ෂණ ගිවිසුමට අදාළ තොරතුරු සියල්ලම හෙළි කළ යුතුවේ. | සත්‍ය |
| 06 | මෝටර් රථයක් රු. 2,500,000 කට රක්ෂණය කර ඇති විටක රු.1,000,000 ක අලාභයක් සිදුවූ විට වන්දි වශයෙන් රු.2,500,000 ක මුදලම ලබාගත හැකි වේ. | අසත්‍ය |
| 07 | හානි පූරණ මූලධර්මය ජීවිත රක්ෂණය සඳහා අදාළ නොවේ. | සත්‍ය |
| 08 | පුද්ගලයෙකුට තමාගේ ඕනෑම ඥාතියෙකු රක්ෂණය කිරීමට නීත්‍යානුකූල අයිතියක් ඇත. | අසත්‍ය |

07. ඇඟලුම් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යන වාසනා, තමා සතු වූ රක්ෂණ ඔප්පුවක් ඇපයට තබා නිවස සෑදීමට ණයක් ලබාගන්නා ලදී. වාසනා ණය මුදල ලබාගැනීමට භාවිත කළේ,

1. ගිනි රක්ෂණ ඔප්පුවකි.
2. මාර්ගස්ථ මුදල් රක්ෂණ ඔප්පුවකි.
3. ජීවිත රක්ෂණ ඔප්පුවකි.
4. මෝටර් රථ රක්ෂණ ඔප්පුවකි.

(2019 O/L)

08. රක්ෂණයට සම්බන්ධ පළමු පක්ෂය ...(1)... ලෙස හැඳින්වෙන අතර, දෙවන පක්ෂය ...(2)... ලෙස හැඳින්වේ.

ඉහත ප්‍රකාශයේ (1) හා (2) ස්ථානවලට අදාළ නිවැරදි යෙදුම් පිළිවෙලින් දැක්වෙන පිළිතුර තෝරන්න.

1. රක්ෂකයා, රක්ෂිතයා
2. රක්ෂිතයා, රක්ෂකයා
3. රක්ෂණ ආයතනය, රක්ෂිතයා
4. රක්ෂකයා, රක්ෂණ ආයතනය

(2018 O/L)

09. විමල්ගේ රු. 2,000,000 ක් වටිනා මෝටර් රථය ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ එම වටිනාකමට රක්ෂණය කර තිබූ අතර එම රථය අනතුරකට භාජනය වී රු. 500,000 ක අලාභයක් සිදුවිය. එම අවස්ථාවේ පදික වේදිකාවේ ගමන් කරමින් සිටි සුනිමල්ටද සුළු තුවාල සිදුවිය.

ඉහත සිද්ධියේ රක්ෂණයට සම්බන්ධ පහත දෑ සඳහන් කරන්න.

(අ) පළමු පාර්ශවය - **විමල්**
(ආ) දෙවන පාර්ශවය - **ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව**
(ඉ) තෙවන පාර්ශවය - **සුනිමල්**
(ඊ) විමල්ට ලැබෙන වන්දි මුදල - **රු. 500,000**

(ලකුණු 02) (2018 O/L)

10. සඳුන්ට හිමි රු. 1,000,000 ක් වටිනා මෝටර් රථය ඔහු එම වටිනාකමටම රක්ෂණය කර තිබුණි. හදිසි අනතුරකින් එම මෝටර් රථයට රු. 400,000 ක හානියක් සිදුවිය. සඳුන් ඒ වෙනුවෙන් රු. 1,000,000 ක වන්දියක් රක්ෂණ සමාගමෙන් ඉල්ලා සිටී. ඔහුට රක්ෂණ සමාගමෙන් ලැබෙන වන්දි මුදල කොපමණද?

1. රු. 400,000　　2. රු. 600,000
3. රු. 1,000,000　　4. රු. 1,400,000　　(2017 O/L)

11. රක්ෂණ මූලධර්ම දෙකක් ලියන්න. (ලකුණු 01) (2017 O/L)

- **රක්ෂ්‍ය හිමිකම.**　　- **හානිපූරණය.**
- **උපරිම විශ්වාසය.**

12. ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ රක්ෂණය කර තිබූ දිසානායකට අයිති මෝටර් රථය ඔහුගේ රියදුරු වන බණ්ඩාර විසින් පදවාගෙන යන අතරතුර අනතුරකට භාජනය විය.

මෙම සිද්ධියේ සඳහන් රක්ෂණයට සම්බන්ධ පළමු පක්ෂය හා දෙවන පක්ෂය පිළිවෙලින් දැක්වෙන පිළිතුර තෝරන්න.

1. දිසානායක, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව
2. ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව, දිසානායක
3. බණ්ඩාර, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව
4. ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව, බණ්ඩාර　　(2016 O/L)